
# සෙල්ලම් ඉස්කෝලේ




නදිනි අමා නෙත්මිණි

# සෙල්ලම් ඉස්කෝලේ

## නදිනි අමා නෙත්මිණි

978-624-208-582-1

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ 3 ශ්‍රේණිය B ඉගෙනුම ලබන නදිනි අමා නෙත්මිණි වන මාගේ දෙවන කෘතිය ලෙස සෙල්ලම් ඉස්කෝලේ කෘතිය නිර්මාණය වේ.

මාදුටු සුන්දර සිහිනය මින් පෙර මා විසින් රචිත කෘතියයි.

2025.02.08

මා හට දැනුම නුවන
ලබාදෙන ගුරු භවතුන්ටත්,
ආදරණීය දෙමාපියන්ටත්
මේ පොත පිළිගන්වමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# සෙල්ලම් ඉස්කෝලේ

උදෑසනින් අවදි වී මම එළියට ආවෙමි. වටපිට බැලුවෙමි. අහස අඳුරු වී වැස්ස කඩා හැලෙන්න වගෙයි. මම ඔබ මොඹ ඇවිදින විට, මට හොඳ අදහසක් පහල විය.

මම දුවගොස් යාහළුවන්ට අපූරු අදහස පැවසුවෙමි. යාලුවෝ හූ කියමින් කෑ ගසා එම අදහසට කැමැත්තක් දැක්වූහ. අපි හැමෝම එක්වී සෙල්ලම් ඉස්කෝලේ ඇරඹුවෙමු.

ඉන්පසු අපි සැමදෙනා එකතු වී විදුහල්පතිතුමෙක්, ගුරුවරියක් ආදිය තෝරාපත් කර ගත්තෙමු. ඔන්න **අපේ සෙල්ලම් ඉස්කෝලේ** ආරම්භ විය.


Book

“ආයුබෝවන් දුවේ, පුතේ” කලනි කිව්වා. “ආයුබෝවන් ටීචර්” ළමයි කිව්වා. “හොඳ පංතියක් වගේ” විදුහල්පතිතුමා කිව්වා. “හොඳ ගුණ දහම් දන්නවා” කිව්වා.

“හරි දුවේ පුතේ එහෙනම් අපි පන්සිල් සමාදන් වෙමු. නමස්කාරය කියන්න, ඇස් දෙක පියාගන්න” කලනි කිව්වා. අද හොඳට ළමයි පන්සිල් ගත්තා ගත්තා. හරි පරිසරය පොත් ටික බෙදන්න.

අද අපි ඉගෙන ගන්නේ ජලය ලබා ගන්නා ක්‍රම, හරි අපි ජලය ලබාගන්නේ මොනවා වලින්ද කියා දන්නවාද ? ඇල ,දොළ, ගංගා වගේ දේවල් වලිනි.

හරි දුවේ පුතේ පොත අරගෙන දිනේ දාලා මේ ටික ලියාගන්න. දැන් පොත් ටික මේසේ උඩින් තියන්න.

ඊට පස්සේ සිංහල පොත් ටික බෙදන්න.

මට එලියට යන්න වෙනවා. පොඩ්ඩකට විදුහල්පති හමුවෙන්න ඒ අතරේ එලියට යන්න එහෙම එපා. මම නායිකාවක් පත් කර ගන්නවා. සඳුනි තමයි නායිකාව.

සඳුනි කාටවත් එළියට යන්න දෙන්න එපා. හරි ටීචර් . හරි එහෙනම් මම යනවා කලණී කිව්වා.



හරි හොඳ ළමයි ටිකක් මම නැති අතරේ
කවුරුවත් එළියට ගියේ නෑ නේද කලණි ඇසුවා.
ඔව් ටීචර් ළමයි කිව්වා පරිසරය පොත්
මැඩම්ගේ මේසේ උඩින් තියන්න කලිනි කිව්වා.

සිංහල පොත් ගන්න, දිනේ දාන්න, අසා ලිවීම ලියන්න එක, දෙක, තුන, හතර, පහ දාගන්න. පළමු වචනය ගස්. ඊළඟ වචනය බසය. අමාරු වචනයක් වෛද්‍යවරිය. හතර දීසිය. පුතේ අන්තිම වචනයද? ඔහු ටීචර් පහ තමයි. ඔන්න පහ තුරුලතා.

ඊට පස්සේ පුතාලා කැමති චිත්‍රයක් අඳින්න. හරි ටීචර්.

හරි පරිසරය පොත් ටිකට එහා පැත්තෙන් සිංහල පොත් ටික තියන්න. විවේක කාලය නේද දැන්? කෑම කාලා සෙල්ලම් කරන්න තුවාල කරගන්න එපා.

හා පන්තියට හැමෝම ආවා. එහෙනම් බුද්ධ ධර්මය පොත් බෙදන්න. බුද්ධ ධර්මය අච්චු පොත් ගන්න තිස්හත පිටුවේ පළවෙනි ඡේදය ලියන්න. බුද්ධ ධර්මය පොත ගෙදර ගෙනියන්න ඡේදය ලියන්න. ගෙදර යන්න ගාථා කියන්න. ආයුබෝවන් සැම දෙනාටම !

ශෝක් සෙල්ලම අපි හෙටත් කරමු. යෙනුල කිව්වා. එහෙනම් හෙට

මම විදුහල්පතිතුමා උපුල් කිව්වේ හරි සතුටිනි.

නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්